WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**45 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

භරත නැටුම් I, II
பரதநாட்டியம் I, II
Bharatha Dancing I, II

## භරත නැටුම් II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා අනෙකුත් ප්‍රශ්නවලින් **හතරක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** කෙටි පිළිතුරු සපයන්න.
- (i) කණ්ඩනඩයේ සොට්කට්ටු කුමක් ද?
- (ii) ඇතින් ම මයුර මුද්‍රාව අල්ලමින් අභිනය දක්වන බාන්දව්‍ය හස්තම් කුමක් ද?
- (iii) පාත්‍ර ප්‍රාණන් වර්ග කීයක් වේ ද?
- (iv) 'ඒන් පල්ලි කොන්ඩීර් අයියා' යන ගීය පිහිටා ඇති උරුප්පඩිය කුමක් ද?
- (v) නන්දනාර් කීර්තනාවන් ගැයුවේ කවුද?
- (vi) මන්මදන්ගේ ඊතලවල ශෝකය පෙන්වන මල කුමක් ද?
- (vii) 'කිටතක තරිකිට දොම්' යන්න පිහිටි තාලය කුමක් ද?
- (viii) මුහුදේ සැඟවූ වේද බේරා ගැනීමට දෙවියන් ගත් අවතාරය කුමක් ද?
- (ix) වර්ණම් යන උරුප්පඩියේ ඇති කොටස් **දෙක** මොනවා ද?
- (x) මඩකලපුවේ ප්‍රබල ලෙසින් රඟපාන නාට්ටුක් කුත්තු ආකාර **දෙක** මොනවා ද?

**2.** (i) භරත නාට්‍ය සම්ප්‍රදායේ උරුප්පඩි අතුරෙන් ප්‍රථමයෙන් රඟපාන උරුප්පඩිය කුමක් ද?
- (ii) මෙම උරුප්පඩියේ ලක්ෂණ මොනවා ද?
- (iii) මෙම උරුප්පඩියේ භාවිත වන තිරුෂ්ටි, සිරොක්රියා භේද හා අඩව් සඳහන් කරන්න.

**3.** පහත සඳහන් හස්තම්වලට අදාළ විනියෝග, ඒවායේ ශ්ලෝක හා අර්ථ සමග ලියන්න.
- (i) කඩකාවර්තනම්
- (ii) කබෝදම්
- (iii) සකඩම්
- (iv) පාස

**4.** තංජයි හතරදෙනාගේ ජීවිත කතාව හා නාට්‍ය කලා සේවය පිළිබඳ ව ලියන්න.

**5.** පහත කරුණුවලට අදාළ ව කෙටි සටහන් ලියන්න.
- (i) ගුරු
- (ii) පාත්‍ර පභිප් ප්‍රාණන්
- (iii) ශබ්දම්

**6.** සප්ත තාල, තාල 35 ක් ලෙස දැක්වෙන වර්ගීකරණය වගුවක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

**7.** (i) භරත කච්චේරියේ භාවිත වන සංගීත උපකරණ සඳහන් කරන්න.
- (ii) ඒවායින් තත් සහිත භාණ්ඩයක රූපය ඇඳ, එහි කොටස් ලකුණු කර, ව්‍යුහය පහදන්න.

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....